# බළන්ගොඩ නගර සභාව

**2018 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවට අයත් පොදු වෙළඳසැළ අංක 15, 16 හා 17 දරණ මස් කඩ, පොදු වෙළෙඳ සැල අංක 11,12 හා 14 දරණ මාළු කඩ, බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරිම, පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම, මහජන පොල ආපන ශාලාව හා පොදු වැසිකිළි ගාස්තු අය කිරීම හා නඩත්තු කිරීමට සුදුසු බදු කරුවන් තෝරා ගැනීම සඳහා ලංසු පත් කැඳවීම.**

2018 ජනවාරි මස පළමු වන දින සිට 2018 දෙසැම්බර් මස තිස් එක් වන දින දක්වා වු වර්ෂයක කාලයක් සඳහා පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන දේපළ බදු දීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ ලේකම් එස්.එච්.ඒ. කරුණාරත්න වන මා විසින් 2017 ඔක්තෝබර් 25 වන දින පෙ. ව. 10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුල දි කාර්යාලීය දුරකථන අංක 045 - 22 872 75 ඇමතීමෙන් හෝ www.balangoda.uc.gov.l වෙතින් ලබාගත හැකි ය.

**ලංසුපත් නිකුත් කිරිමඃ**

2017 ඔක්තෝබර් 24 වන දින ප.ව. 3.00 දක්වා ලංසුපත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දි නිකුත් කරනු ලැබේ.

**ලංසුපත් භාර ගරනීමඃ**

2017 ඔක්තොබර් 25 වන දින පෙ.ව.10.00 දක්වා ලංසුපත් භාර ගනු ලැබේ. ලංසු අයදුම්කරුවන් විසින් සම්පුර්ණ කර මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් කාර්යාලයේ තැන්පත්කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් හෝ ලේකම් බළන්ගොඩ නගර සභාව යන ලිපිනයට 2017 ඔක්තොබර් 25 වන දින පෙ. ව. 10.00 ට පෙර ලැබෙන සේ තැපැලෙන් හෝ යොමුකළ හැකි ය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලංසුපත් විවෘත කිරිමඃ**

2017 ඔක්තෝබර් මස 25 වන දින පෙ.ව. 10.30 ට ලංසුපත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසු අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැකිය.

**ඉහත කී උප ලේඛනය**

| අනු අංකය | ලංසුපත් කැඳවනු ලබන වෙළෙඳාමේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ලංසු ඇප තැන්පත් මුදල | ආපසු ගෙවනු නොලබන ලංසුපත් ගාස්තු | | | අවම මාසික ලංසු මුදල |
|---|---|---|---|---|---|---|
| | | | ගාස්තුව | වැට් | එකතුව | |
| 01 | පොදු වෙළෙඳ සැල අංක 11 දරණ මාළු කඩය | රු.3,000.00 | රු.1,000.00 | රු. 150.00 | රු.1,150.00 | රු. 7,500.00 |
| 02 | පොදු වෙළෙඳ සැල අංක 12 දරණ මාළු කඩය | රු.3,000.00 | රු.1,000.00 | රු. 150.00 | රු.1,150.00 | රු. 7,500.00 |
| 03 | පොදු වෙළෙඳ සැල අංක 14 දරණ මාළු කඩය | රු.3,000.00 | රු.1,000.00 | රු. 150.00 | රු.1,150.00 | රු. 7,500.00 |
| 04 | පොදු වෙළෙඳ සැල අංක 15 දරණ එළු මස් කඩය | රු.3,000.00 | රු.1,000.00 | රු. 150.00 | රු.1,150.00 | රු. 7,400.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 05 | පොදු වෙළෙඳ සැල අංක 16 දරණ එළ හරක් මස් කඩය | රු.10,000.00 | රු.1,000.00 | රු. 150.00 | රු.1,150.00 | රු.144,600.00 |
| 06 | පොදු වෙළෙඳ සැල අංක 17 දරණ කුකුල් මස් කඩය | රු.5,000.00 | රු.1,000.00 | රු. 150.00 | රු.1,150.00 | රු.12,050.00 |
| 07 | මහජන පොළ ආපන ශාලාව | රු.3,000.00 | රු.1,000.00 | රු. 150.00 | රු.1,150.00 | රු. 5,610.00 |
| 08 | බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අයකිරීම | රු.10,000.00 | රු.1,000.00 | රු. 150.00 | රු.1,150.00 | රු.149,200.00 |
| 09 | බළන්ගොඩ බස්නැවතුම්පල පෞද්ගලික බස්ගාල් ගාස්තු අය කිරීම | රු.10,000.00 | රු.1,000.00 | රු. 150.00 | රු.1,150.00 | රු.110,100.00 |
| 10 | බස් නැවතුම්පොළ ගැහැණු හා පිරිමි පොදු වැසිකිළි ගාස්තු අය කර නඩත්තු කිරීම,<br>මහජන පොළ පොදු වැසිකිළිය ගාස්තු අය කර නඩත්තු කිරීම | රු.7,500.00 | රු.2,500.00 | රු. 375.00 | රු.2,875.00 | රු. 85,000.00 |

**විශේෂ කොන්දේසි:**

- ✓ බළන්ගොඩ නගරසභාව අනුමත කර ඇති ගෝ ඝාතකාගාරයකින් මස් සපයා ගත යුතු ය.
- ✓ එක් එක් ලංසුව සඳහා වෙන වෙනම ලංසුපත් ඉදිරිපත් කල යුතු අතර ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ තමා ඉදිරිපත් කරනු ලබන ලංසුවේ නම සඳහන් කළ යුතුය.
- ✓ අවම ලංසුවට අමතරව රජය විසින් පනවනු ලබන බදු මුදල ද ගෙවිය යුතු ය.
- ✓ තෝරා ගන්නා ලද බදු කරුවන් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බළන්ගොඩ නගර සභාවට ගෙවිය හැකි ය. එම මුදලින් තුනෙන් එකක් නොහොත් මසක කුලිය බදුකරු තෝරා ගෙන පළමු පැය තුළ ගෙවිය යුතු ය. එසේ නොගෙවන බදුකරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉතිරි කොටස් දෙක නොහොත් මාස දෙකක කුලිය එකවර ගෙවා 2017.12.31 දින වන විට ගිවිසුම් අත්සන් කළ යුතු ය.
- ✓ සියළුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බළන්ගොඩ නගර සභාව සතු ය.

2017 ඔක්තෝබර් මස 06 වන දින,<br>බළන්ගෙඩ නගරසභාවේදීය.

එස්.එච්.ඒ.කරුණාරත්න,<br>ලේකම්/විශේෂ කොමසාරිස්,<br>බළන්ගොඩ නගර සභාව